සියලු ම හිමිකම් ඇවිරිණි All Rights Reserved

NEW

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය 2022
ආදර්ශ ප්‍රශ්න පත්‍රය
General certificate of Education (Adv. Level) Examination 2022
Model Paper

ආර්ථික විද්‍යාව I
Economics I

21 S I

පැය දෙකයි
Two Hours

උපදෙස්

* *සියලු ම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න*
* *උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න*
* *උත්තර පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් සැලකිල්ලෙන් කියවා පිළිපදින්න*
* ***1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරු වලින් **නිවැරදි** හෝ **ඉතාමත් ගැළපෙන** හෝ පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන පරිදි කතිරයක් (×)** යොදා දක්වන්න*

01. මිනිස් වුවමනා අසීමිත වීම හා සම්පත් සීමිත වීම නිසා,

1. ඕනෑම ආර්ථිකයක කිසියම් පිරිසක් දරිද්‍රතාවයෙන් පෙළේ.
2. ඕනෑම ආර්ථිකයක රාජ්‍ය ණය බර උග්‍ර වේ.
3. ඕනෑම ආර්ථිකයක් සම්පත් හිඟකම පිළිබඳ ප්‍රශ්නයට මුහුණ දේ.
4. ඕනෑම ආර්ථිකයක සම්පත් භාවිතය අකාර්යක්ෂම වේ.
5. ඕනෑම ආර්ථිකයක් මිල යාන්ත්‍රණය ඔස්සේ ප්‍රශ්න විසඳා ගැනේ.

02. ආර්ථික විද්‍යා විෂය හදාරන ශිෂ්‍යයකු ලෙස ඔබට පිළිගත හැකි ප්‍රකාශය කුමක්ද?

1. පූර්ණ සේවා නියුක්තියක් පවතින ආර්ථිකයක් අනිවාර්යෙන්ම නිෂ්පාදන හැකියා වක්‍රය මත පිහිටයි.
2. ආර්ථික භාණ්ඩ නිෂ්පාදනය සඳහා සෑම විටම හිඟ සම්පත් පමණක් යොදා ගැනේ.
3. යෙදවුම් ප්‍රමාණය නොවෙනස්ව තිබිය දී, ඒවායින් ලබාගත හැකි නිමැවුම් ප්‍රමාණය වැඩි කර ගැනීම තුළින් නිෂ්පාදන හැකියා වක්‍රය දකුණට විතැන් කර ගත හැකිය.
4. සම්පත් ඌන උපයෝජන තත්ත්වයක් පවතින විට නිෂ්පාදන හැකියා වක්‍රය වමට විතැන් වේ.
5. වාරි ජලය ගොවීන්ට නොමිලේ ලැබෙන බැවින් එය ආර්ථික නොවන භාණ්ඩයකි.

03. සම්පත් සම්භාරය සීමිත වීම, මිනිස් වුවමනා අසීමිත වීම හා සම්පත් වල විකල්ප භාවිතා පැවතීම නිසා සෑම සමාජයකම,

1. මූලික ආර්ථික ප්‍රශ්න විසඳාගැනීමට මිල යාන්ත්‍රණය යොදා ගනී.
2. නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය මූලයට අවතල ව පිහිටයි.
3. කුමන භාණ්ඩ, කෙසේ,කා සඳහා නිපදවන්නේ ද යන මූලික ආර්ථික ප්‍රශ්න පැන නගී.
4. රාජ්‍ය සහ පෞද්ගලික යන දෙඅංශයේම ක්‍රියාකාරිත්වයක් දක්නට ලැබේ.
5. දුප්පත් ජන කොට්ඨාසයක් සහ ධනවත් ජන කොට්ඨාසයක් ජීවත් වේ.

04. ආර්ථික භාණ්ඩයක ලක්ෂණයක් නොවන්නේ කුමක් ද?

1. ආවස්ථික පිරිවැයක් දරා තිබීම.
2. වුවමනාවන්ට සාපේක්ෂව හිඟ භාණ්ඩ වීම.
3. නිෂ්පාදන ක්‍රියාවලියක් පැවතීම.
4. සැපයුම ස්වභාවධර්මය විසින් තීරණය වීම.
5. මිනිස් තීරණ වල ප්‍රතිඵලයක් වීම.

05. ඉතුරුම්, ආයෝජන හා ප්‍රාග්ධනය යන සංකල්ප නිවැරදිව නිරූපණය වන කාණ්ඩය කුමක්ද?

	ඉතුරුම්	ආයෝජනය	ප්‍රාග්ධනය
1.	යන්ත්‍ර සූත්‍ර	බැංකුවේ මුදල් තැන්පත් කිරීම	අතැති මුදල්
2.	අතැති මුදල්	ගොඩනැගිල්ලක් ඉදිකිරීම	බස් රථයක්
3.	රුපියල් දහසක කොටස් සහතිකයක්	යන්ත්‍ර සූත්‍ර මිලදී ගැනීම	ව්‍යාපාරයකට මුදල් යෙදීම
4.	මෝටර් රථයක් මිලදී ගැනීම	කොටස් මිලදී ගැනීම	ඉතුරුම් තැන්පතුවක්
5.	ඉතුරුම් තැන්පතුවක්	ව්‍යාපාරයකට මුදල් යෙදීම	ගොඩනැගිල්ලක් ඉදිකිරීම

06. ඉල්ලුම් නීතිය, උපකල්පන කිහිපයක් මත පිහිටා ඉදිරිපත් කරයි. මේ අනුව එවැනි උපකල්පනයක් ලෙස නොගැනෙන්නේ මින් කුමක්ද?

1. නිශ්චිත අවස්ථාවක මිල හා ඉල්ලුම් ප්‍රමාණය සැලකිල්ලට ගැනීම.
2. සාමාන්‍ය භාණ්ඩයක ඉල්ලුම සැලකිල්ලට ගැනීම.
3. අනාගත අපේක්ෂා හා පාරිභෝගික ආදායම නිතරම වෙනස් වන බව.
4. තාර්කික ගැනුම්කරුවන්ගේ හැසිරීම සැලකිල්ලට ගැනීම.
5. මිල හැර ඉල්ලුම කෙරෙහි බලපාන අනෙකුත් සාධක නොවෙනස්ව පැවතීම.

07. මෙම රූපසටහනට අනුව S_1 සිට S_2 දක්වා ගමන් කිරීමට හේතුවක් වනුයේ කුමක්ද?



1. තාක්ෂණික පිරිහීමක්.
2. රජය අයකරන බදු ප්‍රමාණය ඉහළ යාමක්.
3. සහනාධාර කපා හැරීම.
4. සේවකයන්ගේ ඉහළ ඵලදායිතාවක්.
5. සැපයුම්කරුවන් ගණන අඩු වීමක්.

08. කිසියම් ප්‍රභේදිත හෝ සමජාතීය භාණ්ඩයක් නිෂ්පාදනය කරනු ලබන ආයතන කුඩා සංඛ්‍යාවකින් සමන්විත වූ කර්මාන්තයක්,

1. පූර්ණ තරඟකාරී ආයතනයකි.
2. කතිපයාධිකාරී ආයතනයකි.
3. ඒකාධිකාරී තරඟ ආයතනයකි.
4. ඒකාධිකාරී ආයතනයකි.
5. ශුද්ධ තරඟකාරී ආයතනයකි.

Sabaragamuwa University Of Sri Lanka

09. ආයතනයක මුළු පිරිවැය (TC) වක්‍රය x, y ලෙස පහත රූප සටහනේ දැක්වේ.



මෙම රූප සටහන අනුව නිමැවුමේ වැඩිවීමක් සමග පිරිවැය වෙනස් වන්නේ කෙසේද?

	සාමාන්‍ය ස්ථාවර පිරිවැය (AFC)	ආන්තික පිරිවැය (MC)
1.	අඩු වේ.	ස්ථාවර වේ.
2.	අඩු වේ.	වැඩි වේ.
3.	ස්ථාවර වේ.	ස්ථාවර වේ.
4.	ස්ථාවර වේ.	වැඩි වේ.
5.	වැඩි වේ.	වැඩි වේ.

10. කෙටි කාලයේ නිෂ්පාදනයේ රැඳී සිටීම සඳහා නිෂ්පාදන ආයතනයකට අවශ්‍ය කරන අවම මිල වනුයේ,

1. අවම සාමාන්‍ය ස්ථාවර පිරිවැයට සමාන මිලයි.
2. අවම සාමාන්‍ය විචල්‍ය පිරිවැයට සමාන මිලයි.
3. සාමාන්‍ය පිරිවැය සහ විචල්‍ය පිරිවැය යන දෙකෙහි එකතුවට සමාන මිලයි.
4. සාමාන්‍ය ස්ථාවර පිරිවැය සහ ආන්තික පිරිවැය යන දෙකෙහි එකතුවට සමාන මිලයි.
5. ආන්තික පිරිවැයයි.

11. පූර්ණ තරඟකාරී ආයතනයක කෙටිකාලීන සැපයුම් වක්‍රය ලෙස සැලකෙනුයේ,

1. ආයතනයේ මුළු පිරිවැය වක්‍රයේ ධන බෑවුම සහිත කොටස වේ.
2. ආයතනයේ සාමාන්‍ය මුළු පිරිවැය වක්‍රයේ ධන බෑවුම සහිත කොටස වේ.
3. ආයතනයේ සාමාන්‍ය පිරිවැය වක්‍රයේ ධන බෑවුම සහිත කොටස වේ.
4. ආයතනයේ සාමාන්‍ය විචල්‍ය පිරිවැය වක්‍රයේ අවම ලක්ෂයට ඉහළින් පිහිටි ආන්තික පිරිවැය වක්‍රය වේ.
5. ආන්තික පිරිවැය වක්‍රයේ ඍණ බෑවුම් සහිත කොටස වේ.

12. ඒකාධිකාරී වෙළෙඳපොළක ලක්ෂණ පහත දක්වා තිබේ. වැරදි ප්‍රකාශය කුමක්ද?

1. නව ආයතන වලට වෙළෙඳපොළට පිවිසීමට බාධාකාරී වේ.
2. භාණ්ඩ සඳහා සමීප ආදේශක නොමැතිවීම.
3. කර්මාන්තය තුළ එකම ආයතනයක් පමණක් සිටීම.
4. වෙළෙඳපොළ ක්‍රියාවලියට සැලකිය යුතු බලපෑම් කිරීමට හැකිවීම.
5. භාණ්ඩයේ මිලෙහි සිදුවන වෙනස් වීමට සාපේක්ෂව ඉල්ලුම් ප්‍රමාණය ඉතා ඉහළ සංවේදීතාවයක් පැවතීම.

Sabaragamuwa University Of Sri Lanka

13. මුළු පිරිවැය (TC) සහ මුළු විචල්‍ය පිරිවැය (TVC) වක්‍ර අතර පවතින සිරස් දුර,

1. නිමැවුම අඩුවන විට අඩු වෙමින් පවතී.
2. නිමැවුම අඩු වන විට වැඩිවෙමින් පවතී.
3. මුළු ස්ථාවර පිරිවැයට (TFC) සමාන වේ.
4. ආන්තික පිරිවැයට (MC) සමාන වේ.
5. සාමාන්‍ය ස්ථාවර පිරිවැය ට (AFC) සමාන වේ.

14. එක්තරා ආයතනයක නිමැවුම 0 වන විට, මුළු පිරිවැය රුපියල් 300 ක් වේ. ඒකක 5ක් නිෂ්පාදනය කරන විට, මුළු පිරිවැය රුපියල් 630 ක් වේ. ඒකක 5 ක් නිෂ්පාදනය කරන විට සාමාන්‍ය විචල්‍ය පිරිවැය (AVC) කොපමණද?

1. රු. 60 කි.
2. රු. 66 කි.
3. රු. 122 කි.
4. රු. 126 කි.
5. රු. 330 කි.

15. පහත සඳහන් දේවල් අතුරින් ජාතික ගිණුම්කරණයට අදාල වන ප්‍රධාන භාවිතයක් වන්නේ,

1. කල් පවත්නා ඇතැම් පරිභෝජන භාණ්ඩ කෙරෙහි දරන වියදම
2. රාජ්‍ය ණය පොළී
3. සම්පත් සංයුතිය හා උපයෝජනය
4. විවේකයෙන් පුද්ගලයින් ලබන සතුට
5. රාජ්‍ය සේවා වල ඵලදායිතාවයෙහි ඇතිවන වෙනස්කම්

16. ආදායම් ප්‍රවේශය අනුව වෙළෙඳපොළ මිල යටතේ දළ දේශීය නිෂ්පාදිතය වන්නේ,

1. සේවක ආදායම් + දළ මෙහෙයුම් අතිරික්තය + මිශ්‍ර ආදායම
2. සේවක ආදායම් + දළ මෙහෙයුම් අතිරික්තය + නිෂ්පාදනය මත අනෙකුත් බදු - නිෂ්පාදනය මත අනෙකුත් සහනාධාර
3. සේවක ආදායම් + දළ මෙහෙයුම් අතිරික්තය + මිශ්‍ර ආදායම + නිෂ්පාදනය මත ශුද්ධ බදු
4. සේවක ආදායම් + දළ මෙහෙයුම් අතිරික්තය + මිශ්‍ර ආදායම - නිෂ්පාදනය මත ශුද්ධ බදු
5. සේවක ආදායම් + දළ මෙහෙයුම් අතිරික්තය + මිශ්‍ර ආදායම + නිෂ්පාදනය මත අනෙකුත් බදු + නිෂ්පාදනය මත අනෙකුත් සහනාධාර

17. දළ මෙහෙයුම් අතිරික්තය සහ ශුද්ධ මෙහෙයුම් අතිරික්තය අතර වෙනස වන්නේ,

1. ප්‍රාග්ධන ක්ෂය
2. ප්‍රාග්ධන පරිභෝජනය
3. ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය
4. ශුද්ධ බදු
5. පොලී ගෙවීම්

18. ජාතික ආදායමට ඇතුළත් නොවූ කුටුම්භ වෙත ලැබෙන ආදායමක් වන්නේ,

1. සමාගමික බදු
2. ප්‍රාග්ධන පරිභෝජනය
3. රාජ්‍ය ණය සඳහා කුටුම්බ වලට ලැබෙන පොලිය
4. සමාජ සංරක්ෂණ දායක මුදල්
5. රාජ්‍ය දේපොළ ආදායම්

Sabaragamuwa University Of Sri Lanka

19. ආර්ථිකයක සමාහාර වියදම අඩු වීමක් හට ගත හැක්කේ පහත සඳහන් කුමන සංරචකයේ වැඩිවීමක් නිසාද?

1. පරිභෝජන වියදම
2. ආණ්ඩුවේ මිලදී ගැනීම්
3. විදේශ ප්‍රේෂණ ගලා ඒම්
4. ආනයන වියදම
5. ආයෝජන වියදම

20. ආවෘත ආර්ථිකයක සමාහාර පරිභෝජන ශ්‍රිතය $C = 200+0.8Y$ බවත්, සමතුලිත ජාතික ආදායම් මට්ටම රුපියල් බිලියන 4000ක් බවත් සලකන්න. මෙම ආර්ථිකයේ ආයෝජන මට්ටම කොපමණද?

1. රුපියල් බිලියන 1600 කි.
2. රුපියල් බිලියන 600 කි.
3. රුපියල් බිලියන 400 කි.
4. රුපියල් බිලියන 380 කි.
5. රුපියල් බිලියන 300 කි.

21. මේ අතරින් සාර්ව ආර්ථික විචල්‍යයක් ලෙස හඳුනාගත හැකි නොවන්නේ,

1. සේවා නියුක්තිය
2. <u>සාධාරණත්වය</u>
3. මිල මට්ටම
4. ජාතික නිෂ්පාදිතය
5. ගෙවුම් ශේෂය

22. ගෙවුම් ශේෂය ආයෝජන ගුණකයේ වටිනාකම වැඩිවන්නේ පහත සඳහන් කවර කරුණක වැඩිවීමක් නිසාද?

1. මුදල් සැපයුම
2. සමතුලිත නිමැවුම
3. පෞද්ගලික ආදායම් බදු අනුපාතිකය
4. ආන්තික පරිභෝජන නැමියාව
5. ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය

23. ආන්තික පරිභෝජන නැමියාව 0.8 ක් වන ආර්ථිකයක, බලයට පත්වන නව රජය විසින් රාජ්‍ය වියදම රුපියල් මිලියන 60 කින් වැඩි කිරීම නිසා එම ආර්ථිකයේ සමාහාර ඉල්ලුම ට වන බලපෑම වනුයේ,

1. සමාහාර ඉල්ලුම මිලියන 60 කින් සංකෝචනය වීම.
2. සමාහාර ඉල්ලුම මිලියන 60 කින් ප්‍රසාරණය වීම.
3. සමාහාර ඉල්ලුම මිලියන 300 කින් ප්‍රසාරණය වීම.
4. සමාහාර ඉල්ලුම මිලියන 300 කින් සංකෝචනය වීම.
5. සමාහාර ඉල්ලුමේ කිසිදු වෙනසක් සිදු නොවීම.

24. පූර්ණ සේවා නියුක්ති නිමැවුම් මට්ටමේ දී පවතින සමාහාර වියදම පූර්ණ සේවා නියුක්ති නිමැවුම් මට්ටම පවත්වා ගෙන යාමට අවශ්‍ය කරන සමාහාර වියදමට වඩා කොතරම් ප්‍රමාණයක් ඉහලින් පවතින්නේ ද යනුවෙන් අදහස් වනුයේ,

1. අවධමනාත්මක පරතරයයි.
2. ධන නිමැවුම් පරතරයයි.
3. උද්ධමනාත්මක පරතරයයි.
4. ආර්ථික කාර්යක්ෂමතාවයයි.
5. ඍණ නිමැවුම් පරතරයයි.

25. වාණිජ බැංකුවක වත්කම් ද්‍රවශීලතාවය අනුව නිවැරදිව පෙළගස්වා ඇත්තේ කුමන ප්‍රකාශයේ ද?

1. ව්‍යවහාර මුදල්, අනෙකුත් ස්ථාවර වත්කම්, භාණ්ඩාගාර බිල්පත්
2. අනෙකුත් ස්ථාවර වත්කම්, ණය හා අත්තිකාරම්, අතැති විදේශ මුදල්
3. අතැති ව්‍යවහාර මුදල්, මහ බැංකුවේ සංචිත, එකතු වෙමින් පවතින මුදල් ශේෂ
4. භාණ්ඩාගාර බිල්පත්, වෙනත් වාණිජ බැංකුවලින් අයවිය යුතු මුදල්, අතැති මුදල්
5. ණය හා අත්තිකාරම්, මහ බැංකුවේ සංචිත, භාණ්ඩාගාර බිල්පත්

Sabaragamuwa University Of Sri Lanka

26. මහ බැංකුව විසින් ආණ්ඩුවේ පිළිනපත් වාණිජ බැංකුවලට අලෙවි කිරීම,

1. පොලි අනුපාතිකයන්හී පහල යාමකට හේතුවේ.
2. වාණිජ බැංකුවල සංචිත මුදල් අඩුවීමට හේතු වේ.
3. මුදල් සැපයුමෙහි වැඩි වීමකට හේතු වේ.
4. වාණිජ බැංකු විසින් මහජනතාව වෙත සපයනු ලබන ණය වැඩිවීමකට හේතු වේ.
5. වාණිජ බැංකුවල සංචිත මුදල් ඉහළ යාමකට හේතුවේ.

27. ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය 10%ක් වන වාණිජ බැංකු පද්ධතියකට අදාල ශේෂ පත්‍රය පහතින් දැක්වේ.

වගකීම්		වත්කම්	
තැන්පතු	80000	සංචිත	8000
		සුරැකුම්පත්	2000
		ණය	70000
	80000		80000

මෙම අවස්ථාවේ මුදල් සැපයුම රුපියල් මිලියන 95000 කි. මහජනතාව තමන් සතු ව්‍යවහාර මුදලින් රුපියල් මිලියන 5000ක් බැංකුවේ තැන්පත් කරයි නම්, නව මුදල් සැපයුම වනුයේ,

1. රුපියල් මිලියන 130,000කි.
2. රුපියල් මිලියන 140,000කි.
3. රුපියල් මිලියන 125,000කි.
4. රුපියල් මිලියන 145,000කි.
5. රුපියල් මිලියන 100,000කි.

28. මහ බැංකුවේ ප්‍රධාන මූල්‍ය ප්‍රතිපත්ති මෙවලම් වන්නේ,

a) සංචිත අවශ්‍යතාවය
b) විවෘත වෙළඳපොළ මෙහෙයුම්
c) වට්ටම් අනුපාතය
d) සංචිතවල පොලී අනුපාතය

1. a සහ b පමණි.
2. a පමණි.
3. c පමණි.
4. a, b සහ c පමණි.
5. ඉහත සියල්ලම.

29. ප්‍රසාරණාත්මක රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියක ප්‍රධාන ලක්ෂණයක් වන්නේ කුමක්ද?

1. අයවැය හිඟය ශුන්‍ය මට්ටමක පවත්වා ගැනීමයි.
2. මුදල් සැපයුම ප්‍රසාරණය කෙරෙන පරිදි මූල්‍ය ප්‍රතිපත්තිය යොදා ගැනීමයි.
3. බදු වලට වඩා රාජ්‍ය වියදම් ඉහළ නැංවෙන පරිදි කටයුතු කිරීමයි.
4. අතිරික්ත අයවැය ප්‍රතිපත්තියක් පවත්වා ගැනීමයි.
5. රාජ්‍ය වියදමට වඩා බදු ඉහළ නැංවෙන පරිදි කටයුතු කිරීමයි.

Sabaragamuwa University Of Sri Lanka

30. බාහිරතා හමුවේ වෙළෙඳපොළ අසාර්ථක වීම් නිවැරදි කිරීමට හෝ අවම කිරීමට ගත හැකි ක්‍රියා මාර්ගයක් නොවන්නේ,

1. බාහිරතා අභ්‍යන්තරගත කිරීම.
2. සලාකනය හා නීතිරීති සම්පාදනය.
3. ඒකාධිකාරයන් ගොඩනැගීම සඳහා සහාය වීම.
4. විශාල ලෙස බාහිර ප්‍රතිලාභ ජනනය කරන භාණ්ඩ මත සහනාධාර ලබාදීම.
5. විශාල ලෙස බාහිර පිරිවැය ජනනය කරන භාණ්ඩ මත බදු පැනවීම.

31. පෞද්ගලික පිරිවැයට වඩා සමාජ පිරිවැය වැඩි වන්නේ පහත කුමන අවස්ථාවේදී ද? (MPC>MSC)

1. ගංවතුර පාලන ව්‍යාපෘති සහ මී මැසි පාලනය.
2. වන විනාශය සහ පොසිල ඉන්ධන දහනය කරන නිෂ්පාදන ක්‍රියා.
3. අධ්‍යාපනය සහ බෝ වන රෝග එන්නත් ලබා ගැනීම.
4. මෝටර් රථ ධාවනය සහ මත්පැන් පානය.
5. ජල මූලාශ්‍ර ආරක්ෂා කිරීමේ ව්‍යාපෘති සහ සෞඛ්‍ය සේවාවන්.

32. සංකෝචනාත්මක රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය හා ප්‍රසාරණාත්මක රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය පිළිබඳ ප්‍රකාශයන් පිළිවෙලින් දැක්වෙන්නේ,

1. බදු අනුපාතිකය ඉහළ දැමීම, පොලී අනුපාතය ඉහළ දැමීම.
2. බදු අනුපාතිකය පහළ දැමීම, රාජ්‍ය වියදම් ඉහළ දැමීම.
3. පොලී අනුපාතිකය පහළ දැමීම, බදු අනුපාතය පහළ දැමීම.
4. රාජ්‍ය වියදම් අඩු කිරීම, බදු අනුපාතිකය පහළ දැමීම.
5. බදු අනුපාතිකය ඉහළ දැමීම, රාජ්‍ය වියදම් ඉහළ දැමීම.

33. ශ්‍රී ලංකාවේ බදු අනුකූලතාවය පහළ මට්ටමක පවතී. ඊට හේතුවක් නොවන්නේ මේ අතුරින් කුමක්ද?

1. සංකීර්ණ බදු ව්‍යුහයක් පැවතීම.
2. බදු පරිපාලනය අකාර්යක්ෂම වීම.
3. බදු නීති පිළිබඳ ඇති නොදැනුවත්භාවය.
4. වාර්ෂික ආදායම් නිසි ලෙස හෙළිදරව් කිරීම.
5. ඉහළ ආන්තික බදු අනුපාතිකය.

34. පහත දැක්වෙන බදු අය කිරීමේ මූලධර්ම සහ ඒවා පිළිබඳ වඩාත්ම නිවැරදි අර්ථකථනයක් ලබා දී ඇති ප්‍රකාශය තෝරන්න.

1. සාධාරණත්වය - සමාන ආර්ථික හැකියාවක් ඇති අය සඳහා සමාන අනුපාතිකයන්ගෙන් බදු අය කළ යුතු බවයි.
2. නම්‍යශීලී බව - ආර්ථිකයේ හට ගන්නා සුළු වෙනස්කම් වලට බදු ක්‍රමය සංවේදී විය යුතු බවයි.
3. පහසු බව - බදු ගෙවීම සම්බන්ධයෙන් වන සියලුම කාර්යයන් සඳහා බදු ගෙවන්නන් ස්වේච්ඡාවෙන් ඉදිරිපත් විය යුතු බවයි.
4. කාර්යක්ෂම බව - වෙළෙඳපොළ තීරණ ගැනීමේ ක්‍රියාවලිය විකෘති වන පරිදි බදු අය කළ යුතු බවයි.
5. පිරිමැසුම් සහිත බව - බදු ගෙවීමේදී බදු ගෙවන අයටත්, බදු එකතු කිරීමේදී රජයටත් දැරීමට සිදුවන වියදම් හැකිතාක් අවම කළ යුතු බවයි.

35. සමස්ත අයවැය හිඟයක ආර්ථික ප්‍රතිවිපාකයක් නොවන්නේ මින් කවරක්ද?

1. අයවැය හිඟය වැඩි වීම සමස්ත වියදම් ඉහළ යාමටත්, උද්ධමන පීඩන ඇති වීමටත් හේතු වේ.
2. දේශීය වෙළඳපොලෙන් විශාල ලෙස ණය ගැනීම නිසා පෞද්ගලික අංශයේ ආයෝජන අඩපණ වීම.
3. අයවැය හිඟය පියවීමට දේශීය ණය යොදා ගැනීම තුළින් පොලී අනුපාතය පහළ යාම.
4. විශාල අයවැය හිඟයක් නිසා බිහිවන සාර්ව ආර්ථික අස්ථායිතාවය, ආර්ථික වෘද්ධි ක්‍රියාවලියට හානිදායක වීම.
5. විදේශීය ණය විශාල වශයෙන් යොදා ගැනීම නිසා ජාත්‍යන්තර ණය අර්බුදයන්ට මුහුණ පෑමට සිදු වීම.

Sabaragamuwa University Of Sri Lanka

36. වෙළඳ අනුපාතය යහපත් වන විට, පහත ප්‍රකාශ අතරින් පිළිගත නොහැකි ප්‍රකාශය කුමක්ද?

1. දෙන ලද ආනයන ප්‍රමාණයක් මිලට ගැනීම සඳහා අපනයන කළයුතු ඒකක ප්‍රමාණයක් අඩු වේ.
2. වෙළෙඳ ගිණුමේ අතිරික්තයක් ඇති වේ.
3. විදේශ විනිමය අනුපාතිකය වර්ධනය වේ.
4. දේශීය අපනයන සඳහා විදේශ ඉල්ලුම ඉහළ යා යුතුය.
5. ආනයන වටිනාකම වැඩි වන වේගයට වඩා වැඩි වේගයකින් අපනයන වටිනාකම ඉහළ නගී.

37. බහු ආංශික තාක්ෂණික හා සහයෝගීතාව උදෙසා වන බෙංගාල බොක්ක ආශ්‍රිත පුරෝගාමීන්ගේ සංවිධානයේ (BIMSTEC) සාමාජික රටවල් නිවැරදිව දැක්වෙන වරණය තෝරන්න.

1. බංගලාදේශය, ඉන්දුනීසියාව, මාලදිවයින, ශ්‍රී ලංකාව, තායිවානය.
2. බහමා දූපත්, ඉන්දියාව, මියන්මාරය, ශ්‍රී ලංකාව, තායිලන්තය.
3. බංගලාදේශය, ඉන්දියාව, මියන්මාරය, ශ්‍රී ලංකාව, තායිලන්තය.
4. බෙල්ජියම, ඉන්දුනීසියාව, මාලදිවයින, සිරියාව, ටැන්සානියාව.
5. බංගලාදේශය, අයර්ලන්තය, මාලදිවයින, ශ්‍රී ලංකාව, තායිලන්තය.

38. ඉන්දියාවේ හා බංගලාදේශයේ ශ්‍රමිකයෙකු පැයකදී කරනු ලබන නිමැවුම් ප්‍රමාණය පහත දැක්වේ.

රට	පෑන්	පැන්සල්
ඉන්දියාව	8	4
බංගලාදේශය	6	2

මෙම දත්ත ඇසුරින් දෙරට අතර නිදහස් වෙළඳාම සම්බන්ධයෙන් කවර ප්‍රකාශය නිවැරදි ද?

1. ඉන්දියාව පැන්සල් අපනයනය කරන අතර, බංගලාදේශය පෑන් අපනයනය කරයි.
2. ඉන්දියාව පෑන් අපනයනය කරන අතර, බංගලාදේශය පැන්සල් අපනයනය කරයි.
3. ඉන්දියාව පෑන් සහ පැන්සල් යන දෙකම අපනයනය කරයි.
4. බංගලාදේශය පෑන් සහ පැන්සල් යන දෙකම අපනයනය කරයි.
5. ඉන්දියාව පැන්සල් අපනයනය කරන අතර, පෑන් පිළිබඳ සාපේක්ෂ වාසියක් කිසිදු රටකට නොමැති නිසා පෑන් පිළිබඳ වෙළඳාමක් නොපවතී.

39. ඇමරිකානු ඩොලරයකට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලෙහි වටිනාකම රුපියල් 112ක සිට රුපියල් 108 දක්වා වෙනස් වේ. පහත දැක්වෙන කෙබඳු ප්‍රකාශයක් මෙම තොරතුරු සමඟ අනුකූල වේද?

1. ශ්‍රී ලංකාව විසින් ඇමරිකා එක්සත් ජනපදයට කරනු ලබන අපනයන අඩුවනු ඇත.
2. ඇමරිකා එක්සත් ජනපදයෙන් ගෙන්වනු ලබන ආනයන පෙරට වඩා මිල අධික වනු ඇත.
3. එක්සත් ජනපද ඩොලරයකට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල ක්ෂය වී තිබේ.
4. ශ්‍රී ලංකා රුපියලට සාපේක්ෂව ඇමරිකානු ඩොලරයේ අගය ඉහල ගොස් ඇත.
5. ඇමරිකා එක්සත් ජනපදයට යන ශ්‍රී ලාංකික සංචාරකයින්ට පෙරට වඩා අවාසිදායක තත්ත්වයක් ඇති වේ.

40. පහත සඳහන් සියල්ල අතරින් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියට බලපාන පරිදි හැසිරවිය හැකි විචල්‍යයක් නොවන්නේ,

1. පෞද්ගලික ආදායම් බදු
2. භාණ්ඩ හා සේවා සඳහා රාජ්‍ය වියදම්
3. විශ්‍රාමික ප්‍රතිලාභ සඳහා රජයේ වියදම්
4. පොළී අනුපාත
5. සහනාධාර වල වෙනස්වීම

41. අවපාතයට එරෙහිව සටන් කිරීමට රජයට හැකි වන්නේ,

1. මුදල් අනුපාතිකය අඩු කිරීමෙන් පොලී අනුපාත අඩු කිරීම මඟින්.
2. සමස්ත ඉල්ලුම වැඩි කිරීම සඳහා බදු අඩු කිරීම මඟින්.
3. බදු ඉහළ දැමීමෙන් හැකිළුණු රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම මඟින්.
4. අයවැය සමතුලිත කිරීම සඳහා රජයේ වියදම අඩු කිරීම මඟින්.
5. ඉහත සියල්ලම නිවැරදි වේ.

Sabaragamuwa University Of Sri Lanka

42. ආර්ථික වෘද්ධිය හා සංවර්ධනය පිළිබඳ නිවැරදි ප්‍රකාශය වනුයේ,

1. ආර්ථික වර්ධනය ගුණාත්මක සංකල්පයක් වන අතර, ආර්ථික සංවර්ධනය ප්‍රමාණාත්මක සංකල්පයකි.
2. ආර්ථික වෘද්ධිය මගින් ආර්ථිකය සතු නිෂ්පාදන ධාරිතාවය ප්‍රසාරණය වීමක් පෙන්නුම් කරන අතර, සංවර්ධනය මගින් ආර්ථිකයක වෙසෙන මිනිසුන්ගේ ජීවන තත්ත්වයෙහි යහපත් වර්ධනයක් පෙන්නුම් කරයි.
3. ආර්ථික වෘද්ධියකදී ආර්ථිකයේ මූර්ත නිමැවුම කෙටිකාලීනව ප්‍රසාරණය වීමක් සිදුවන අතර, සංවර්ධනයක දී මූර්ත නිමැවුම දිගුකාලීනව ප්‍රසාරණය වේ.
4. ආර්ථික වෘද්ධිය යනුවෙන් අදහස් වන්නේ භාණ්ඩ හා සේවා නිෂ්පාදනයේ ගුණාත්මකභාවයෙහි ප්‍රසාරණය වීමක් වන අතර, සංවර්ධනය යනුවෙන් අදහස් වන්නේ භාණ්ඩ හා සේවා නිෂ්පාදන ධාරිතාවය ප්‍රසාරණය වීමකි.
5. ආර්ථික වෘද්ධිය, සංවර්ධනයට වඩා පුළුල් සංකල්පයකි.

43. තිරසාර සංවර්ධනය යන්නෙන් අර්ථ දැක්වෙන්නේ,

1. මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ අඛණ්ඩ වැඩිවීමක් සමග ස්වාභාවික සම්පත් පූර්ණ ලෙස උපයෝජනය කිරීමයි.
2. අනාගත පරම්පරා වලට තම අවශ්‍යතා සපුරා ගැනීමට ඇති හැකියාවට හානියක් නොවන ලෙස වර්තමාන පරම්පරාව තම අවශ්‍යතා සපුරා ගැනීමයි.
3. අනාගත පරිභෝජනය සඳහා සම්පත් ඉතිරි කර වර්තමාන පරිභෝජනය අඩු කිරීමයි.
4. වර්තමානයේ පාරිසරික හානියක් ඇති වුවත්, අනාගතයේ ආර්ථික හා සමාජීය වර්ධනයට සම්පත් ඉතිරි කිරීමයි.
5. සමස්ථ ආර්ථිකය තුළ ගුණාත්මක මට්ටම් හා ප්‍රමාණාත්මක මට්ටම් වර්ධනය වීමයි.

44. මානව සංවර්ධන දර්ශකයට අදාළ සංරචකයක් වනුයේ,

1. උපතේදී ආයු අපේක්ෂාව.
2. වැඩිහිටි සාක්ෂරතා අනුපාතිකය.
3. සේවා නියුක්ත ජනගහන ප්‍රතිශතය.
4. ස්ථාවර මිල යටතේ දළ දේශීය නිෂ්පාදිතයේ වටිනාකම.
5. දළ ජාතික ආදායම.

45. ලෝරන්ස් වක්‍රයෙන් අදහස් කරනුයේ,

1. සරල රේඛාවෙන් ඈත් වන විට ආදායම් අසමානතාවය අඩුවන අතර, සරල රේඛාවට ආසන්න වන විට ආදායම් විශමතාවය වැඩිවන බවයි.
2. සම ව්‍යාප්ති රේඛාවෙන් ඈත්වන විට ආදායම් අසමානතාවය වැඩිවන අතර, සම ව්‍යාප්ති රේඛාවට ආසන්න වන විට ආදායම් අසමානතාවය අඩුවන බවයි.
3. ජනගහනයේ දරිද්‍රතා මට්ටමේ සිදුවන වෙනස්වීමයි.
4. වෙළෙඳපොළ සම්පත් බෙදා වෙන්කිරීමේ කාර්යක්ෂමතාවය හා නිෂ්පාදනයේ කාර්යක්ෂමතාවය නිසා ආදායම් මට්ටමේ සිදුවන වෙනසයි.
5. රටක් තුළ ඉහළ ආදායම් ලබන පිරිස සහ පහළ ආදායම් ලබන පිරිස පෙන්වයි.

46. ව්‍යාපාරික ආයතන වෙළඳපොලෙන් නික්මයාම, නව ආයතන ඇතුල්වීම හා පුද්ගලයින් නව රැකියා සොයා යාම ආදී සාධනයන් නිසා ඇතිවන සේවා වියුක්තිය වන්නේ,

1. ව්‍යුහාත්මක සේවා වියුක්තිය
2. වාරික සේවා වියුක්තිය
3. සාර්ෂික සේවා වියුක්තිය
4. සැඟවුණු සේවා වියුක්තිය
5. චක්‍රීය සේවා වියුක්තිය

47. දැනුම් ආර්ථිකය පිළිබඳ දර්ශකය සකස් කිරීමට යොදා නොගන්නා නිර්ණායකය වන්නේ,

1. ආර්ථික සානුබලය
2. පර්යේෂණ හා සංවර්ධනය
3. අධ්‍යාපනය හා පුහුණුව
4. නව්‍යතාවයන් උපයෝගී කරගැනීමේ නැඹුරුව
5. ආයතනික ව්‍යුහයන්

Sabaragamuwa University Of Sri Lanka

48. BRICS යන නාමාකරණය යටතේ හඳුනාගනුයේ ඉතා වේගයෙන් නැගී එන සහ කාර්මික වෙළෙඳපොළ ආර්ථික කිහිපයක් වන අතර, මෙම ආර්ථිකයන් දැක්වෙන නිවැරදි පිළිතුර වන්නේ,

1. බ්‍රසීලය, රුමේනියාව, ඉන්දියාව, චීනය, දකුණු අප්‍රිකාව
2. බංගලාදේශය, රුසියාව, ඊශ්‍රායලය, චීනය, දකුණු අප්‍රිකාව
3. බ්‍රසීලය, රුසියාව, ඉන්දියාව, චීනය, දකුණු අප්‍රිකාව
4. බ්‍රසීලය, රුසියාව, ඉන්දියාව, චීනය, ශ්‍රී ලංකාව
5. බ්‍රසීලය, රුසියාව, ඉන්දියාව, චීනය, දකුණු කොරියාව

49. ගෝලීයකරණය මෙහෙයවනු ලබන ප්‍රධාන සංරචක ද්විත්වය ඇතුලත් වන නිවැරදි පිළිතුර වන්නේ,

1. පරිමාණානුකූල පිරිමැසුම් සහ තාක්ෂණයේ වර්ධනය.
2. ආරක්ෂණවාදී ප්‍රතිපත්ති ඉවත්කිරීම සහ තාක්ෂණයේ වර්ධනය.
3. නිර්බාධ ආර්ථික ප්‍රතිපත්ති සහ රටවල් අතර සාපේක්ෂ වාසිය වෙනස් වීම.
4. තාක්ෂණයේ වර්ධනය සහ වෙළඳපොළ විශාලත්වය.
5. තාක්ෂණයේ වර්ධනය සහ නිර්බාද ආර්ථික ප්‍රතිපත්ති.

50. 2021 වසරේ ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන අනුපාතය වන්නේ,

1. 4.0
2. 5.5
3. -2.1
4. 3.7
5. -3.7

Sabaragamuwa University Of Sri Lanka